# අප හමුවේ ඇති අභියෝගය

දේශපාලනයේ වෙනසක් සිදුවෙමින් පවතියි. එය කිනම් දිශාවකට යන්නේ දැයි තීරණයකෙරෙන්නේ ජනතාවගේ කැමැත්ත මත පමණක් නොවීම අවාසනාවකි. බටහිර ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය යටතේ දේශපාලන පක්ෂවලට ජනතාව මෙහෙයවීමට ඇති අවකාශය ජනතාවට පක්ෂ මෙහෙයවීමට ඇති අවකාශයට වඩා වැඩි ය. දේශපාලන පක්ෂ ජනතාවගේ ඡන්දය දිනාගැනීමට මැතිවරණ කාලවල දී ජනතාවට අවශ්‍ය ආකාරයට යම් කතාබහක යෙදුන ද, මැතිවරණයෙන් පසුව තමන්ට අවශ්‍ය ආකාරයට වැඩකරනු පෙනේනට ඇත. එහෙත් මේ සම්බන්ධයෙන් අනෙක් බොහෝ පක්ෂවලට වඩා ශ්‍රී ල නි පක්ෂයේ වාර්තාව අගනේ ය. ජනතාවට වෙනත් පක්ෂයකට වඩා ශ්‍රී ල නි පක්ෂය මෙහෙයවීමේ හැකියාව වෙයි. මහින්ද රාජපක්ෂ මහතාට එතෙර දී නොයෙකුත් බලපෑම් කර ඇති බවට සාක්ෂි අවශ්‍ය නො වේ. ඊනියා තුන්වැනි ලෝකයේ දුප්පත් යැයි කියන රටකට බටහිර රටවල් පමණක් නොව තුන්වැනි ලෝකයේ බලවත්තු ද බලපෑම් කරති. ලංකාව සම්බන්ධයෙන් ඉන්දීය ආණ්ඩුව අනුගමනය කරන්නේ බලපෑම් දැමීමේ ප්‍රතිපත්තියකි. ඉන්දීය අගමැතිවරයා රාජපක්ෂ මහතාට කියා තිබුණේ බලය බෙදීම පිළිබඳව ය. ඉන්දියාවට අවශ්‍ය ඒ රටට හොඳ විසඳුමක් මිස අපට ගැලපෙන විසඳුමක් නො වේ. ඒ අතර බටහිරයන් හැමදාමත් කියන්නේ දෙමළ ජනතාවට ඇති ඊනියා ප්‍රශ්නය විසඳීමට බලය බෙදන ලෙස ය. දෙමළ ජනයා තම ඉල්ලීම් ඉදිරිපත්කරන්නේ කරුණු දෙකක් මත පදනම් වී ය. එකක් අවුරුදු දෙදහසකට වැඩි කාලයක් ඔවුන් මෙරට නිත්‍ය පදිංචිකරුවන් ව යම් යම් ප්‍රදේශවල ජීවත්වූ බවත්, ඉන් උතුරු හා නැගෙනහිර පළාත් ප්‍රධාන බවත් ය. දෙවනුව ඔවුන් කියන්නේ සිංහලයන් බහුතරය වීම හේතුවෙන් බහුතර ප්‍රජාතන්ත්‍රවාදය  උපයෝගීකරගනිමින් දෙමළ ජනයාගේ හඬට කන් නො දෙන බව ය. ඒ පදනම්කරගනිමින් තමන්ගේ කටයුතු තමන්ට අවශ්‍ය ආකාරයට කරගෙන යෑම සඳහා ඔවුහු තමන් පදිංචි වී සිටියේ යැයි කියන උතුරු හා නැගෙනහිර පළාත්වලට බලය බෙදන ලෙස ඉල්ලති. දෙමළ ජනයා මෙරට තම ඓතිහාසික යැයි කියන සංස්කෘතිය මත පදනම් වී සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන නොදීම සිංහලයන් කිසිසේත්ම අනුමත නොකරන බව ඔවුන්ට අමතක වෙයි. එමෙන් ම උතුරු හා නැගෙනහිර පළාත් සුද්දන්ගේ නිර්මාණයක් බවත් එහි ඉතිහාසය 1889 න් ඔබ්බට නොයන බවත්, ඒ පළාතේ දෙමළ ජනයා දැනට වුව ද පදිංචි වී ඇත්තේ මුහුදු තීරයේ පමණක් බවත් ඔවුහු පහසුවෙන්ම අමතක කරති.

ශ්‍රී ල නි පක්ෂය යනු තම ඡන්ද පදනමට කන්දෙන පක්ෂයකි. ඡන්ද පදනමට යම් ප්‍රමාණයකට පක්ෂය මෙහෙයවිය හැකි ය. එහෙත් පක්ෂය තමන් කියන දෙයට කන් නොදුන් පමණින් ඡන්ද පදනම හිටි අඩියේ ශ්‍රී ල නි පක්ෂය අත්හැර යාවි යැයි ජ වි පෙ නො සිතිය යුතු ය. 1987-90 අවධියේ ජ වි පෙ දංගෙඩියට දැක්ක වූ යුවළක් නැවතත් ක්‍රියාත්මක වන බව පෙනෙන්නට ඇත. අද යම් යම් බලවේග ජ වි පෙරමුණට වැරදි උපදෙස් දෙන බව පැහැදිළි ය. ජ වි පෙරමුණට ශ්‍රී ල නි පක්ෂයේ ඡන්ද පදනම දිනාගැනීම උගහට ය. ඒ පක්ෂයට වරදින්නේ තමන් ගැන අධිතක්සේරු තබාගත්විට ය. ජ වි පෙරමුණට රටේ යම් පදනමක් ඇත. එහෙත් ශ්‍රී ල නි පක්ෂය වැඩිකල් නොගොස් බටහිර හා ඉන්දියාවේ බහට අවනත වී ඊනියා සාම සාකච්ඡා අරඹනු ඇති බවත් එවිට ශ්‍රී ල නි පක්ෂයේ ඡන්ද පදනම වැල නොකැඩී තමන් වෙත ඇදෙන බවත් ජ වි පෙ උපකල්පනයකරන්නේ නම් ඒ වැරදි ය. එවැනි අවස්ථාවක ආණ්ඩුවට විරුද්ධව ක්‍රියා කිරීමේ දී හමුදාව පවා තමන් සමග එකතුවන්නේ යැයි ජ වි පෙරමුණේ ඇතැම් නායකයන් සිතන්නේ නම් ඒ අමු ම අමු තකතිරු උපකල්පනයකි. තීරණාත්මක අවස්ථාවක දී වුව ද ජනතාව පක්ෂ අත්හරින්නේ කිහිප වාරයක් කල්පනාකිරීමෙන් පසුව ය. ලංකාවේ හමුදාව ජනතාව තරමටවත් තම (ආණ්ඩුවට ඇති) පක්ෂපාතීත්වය අත්නොහරියි. මේ වතාවේ ඒ එසේ නොවන්නේ යැයි යමකු සිතන්නේ නම් ඒ මුළාවකි. එහෙත් ජ වි පෙට ලැබෙන උපදෙස්වලට අනුව ඒ එසේ නොවන බව කියැවෙනවා විය හැකි ය.  උපදේශකයන් ජ වි පෙට ඒත්තු ගන්වනු ඇත්තේ ජනතාව පක්ෂයට එකතුවනු ඇති බව ය.

මේ අතර ලංකා සමසමාජ පක්ෂය නිවේදනයක් නිකුත්කරමින් අද ඔවුන් දකුණ යැයි කියන උතුරු මැද පළාතේ සිට දකුණු පළාත දක්වා ප්‍රදේශයෙහි ජාතිවාදය පතුරුවා හැර ඇත්තේ ජ වි පෙ හා ජා හෙළ උරුමය බව පවසා ඇත. මේ පක්ෂ දෙක සමග මගේ කිසිම සම්බන්ධයක් නැත. ඔවුන්ට අවස්ථාවක් ලද විට ඔවුහු මා විවේචනය කරති. හෙළ උරුමයේ නායකයකු සැමදාම පවසන්නේ මා නිකම් ම නිකම් ලේඛකයකු පමණක් බව ය. ජාතික ව්‍යාපාරයේ ප්‍රගතිය ඔවුන් නිසා ම පමණක් වී යැයි කීමට ඔහු උත්සාහ දරයි. පසුගිය දා ජ වි පෙට සම්බන්ධ ශිෂ්‍ය සංගමය මා දරණ මතවලට විරුද්ධ ව තමන් නොදන්නා ක්වොන්ටම් භෞතිකයක් හා ඊනියා දයලෙක්තිකයක් ගැන ලියන්නට ගොස් අත

© Prof. Nalin De Silva

පුච්චාගෙන ඇත. ජ වි පෙට අවශ්‍ය වී ඇත්තේ තමන් තවමත් මාක්ස්වාදය අතහැර නොමැති බව පෙන්වීම විය හැකි ය. ජනතාව අද අනුමතකරන්නේ ජාතික මතවාද මිස මාක්ස්වාදී මතවාද නො වෙයි. එබැවින් මාක්ස්වාදය වෙනුවෙන් පෙනී සිට පළල් ජනතාව තබා සරසවි සිසුන්වත් දිනාගත හැකි යැයි නොසිතමි. කෙසේ වුවත් අද ජ වි පෙ තමන් කළ යුතු කාර්යභාරයන් වෙනුවට වෙනත් දේ කරණු පෙනේනට ඇත. එමගින් සිදුවන්නේ විජාතික බලවේග ශක්තිමත් වීම පමණකි. රටේ සැලකිය යුතු නොව ඉතා ස්වල්ප ඡන්ද පදනමක් ඇති සමසමාජ පක්‍ෂයට අද අවශ්‍ය වන්නේ ජ වි පෙ හා ජාතික හෙළඋරුමය ආණ්ඩුවේ පරිධියෙන් ද ඉවතට විසිකර දැමීම ය. සමසමාජ පක්‍ෂයට රටේ කිසිම බලයක් නැතිව තිබිය දීත් ඔවුන් සූදානම් වන්නේ මෙරට අද ජාතික බලවේග නියෝජනයකරන පක්‍ෂ අතර අසමගියක් ඇතිකිරීමට ය. ආණ්ඩුවෙන් ජ වි පෙ හා ජා හෙළ උරුමය ඉවත්කර දෙමළ ප්‍රශ්නයේ දී තම සගයා වූ එ ජා පක්‍ෂය ආණ්ඩුවට ඇතුළත් කරගැනීම සමසමාජ පක්‍ෂයේ අවශ්‍යතාව වෙයි. ඒ පක්‍ෂය ඉතා අවස්ථාවාදීව රත් වූ යකඩය තැලීමට සූදානම් වෙයි.

සමසමාජ පක්‍ෂය ධනපති ක්‍රමයට විරුද්ධ වුව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධ නො වෙයි. මාක්ස්වාදීහු සමස්තයක් ලෙස ගත්කල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධ නො වෙති. ඔවුහු මාක්ස් අනුව යමින් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිවාදීහු වෙති. අවසාන විග්‍රහයෙහි දී සමසමාජ පක්‍ෂය විජාතික බලවේගයක් මිස ජාතික බලවේගයක් නො වෙයි. අද සමසමාජ පක්‍ෂයට වඩා කිට්ටු වන්නේ ශ්‍රී ල නි පක්‍ෂයවත් තමන් තවමත් මාක්ස්වාදී යැයි කියන ජ වි පෙරමුණවත් නොව එ ජා පක්‍ෂය ය. සමසමාජ පක්‍ෂයත් එ ජා පක්‍ෂයත් දෙකම මෙරට විජාතික බලවේගවල පක්‍ෂ වෙයි. ඒ පක්‍ෂ දෙකට පමණක් නොව මෙරට බටහිර තානාපතිවරුන් බටහිරයන්ගෙන් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන ආදී සකලවිධ විජාතික බලවේගවලට අවශ්‍ය වනුයේ ශ්‍රී ල නි පක්‍ෂය, ජ වි පෙ හා ජා හෙළ උරුමය අතර ඇති සම්බන්ධය කඩා බිඳ දමා ආණ්ඩුවට එ ජා පක්‍ෂය හවුල් කරවීම ය. ඒ සමග මහින්ද රාජපක්‍ෂ මහතා නොදැන සිටිය ද ඔහුගේ ශක්තිය ද බිඳ වැටෙනු ඇත. ඒ මහතාගේ ශක්තිය මෙරට ජාතික බලවේගවල ශක්තිය මිස විජාතික බලවේගවල ශක්තිය නො වේ. විජාතික බලවේගවල ජනාධිපති අපේක්‍ෂකයා වූයේ රනිල් වික්‍රමසිංහ මහතා ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පමණක් නොව ඇය වටා සිටි, දැනටත් රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධකම් පවත්වන ශ්‍රී ල නි ප ප්‍රධානීන් කිහිප දෙනකු ද රාජපක්‍ෂ මහතාට සහාය නොදුන් බව රහසක් නො වෙයි. ඒ අය ද ඇතුළු විජාතික බලවේගවලට අද අවශ්‍ය ජ වි පෙ හා ජා හෙළ උරුමය රාජපක්‍ෂ මහතාගෙන් ඉවත්කිරීම ය. ඒ පක්‍ෂවලට විරුද්ධව අද වැඩියෙන් ම කතාකරන ශ්‍රී ල නි පාක්‍ෂිකයන් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ හිතවතුන් වීම ද අරුමයක් නො වේ.

විජාතික බලවේගවලට ආණ්ඩුවට එකතුකිරීමට අවශ්‍ය තවත් පක්‍ෂයක් නම් හකීම් මහතාගේ මුස්ලිම් කොංග්‍රසය ය. එවිට ඉතිරි වී ඇත්තේ කොටි සංවිධානයේ සෘජු නියෝජිතයා වූ දෙමළ ජාතික සංධානය පමණ ය. ජ වි පෙ හා ජා හෙළ උරුමය පන්නා දමා, අනෙක් බොහෝ දෙමළ හා මුස්ලිම් පක්‍ෂවල විරුද්ධතාව මැද වුව ද හැකිනම් දෙමළ ජාතික සංධානය ද ආණ්ඩුවට එකතුකිරීමට විජාතික බලවේගවලට අවශ්‍ය නම් එය පුදුමයට කරුණක් නොවිය යුතු ය. හකීම් මහතා කවුරුන්දැයි නොදන්නා අයකු අද දේශපාලනයෙහි නිරතවුවන් අතර ඇතැයි මම නො සිතමි. ඒ මහතා කිනම් හේතුවක් නිසා හෝ කොටි සංවිධානයට පක්‍ෂපාතී දේශපාලනයක නිරත වෙයි. පසුගිය දා පොතුවිල් මුස්ලිම් ඝාතනයේ දී ඔහු නිසැකව ම කියා සිටියේ ඒ විශේෂ කාර්ය බල සාධකය විසින් කරන ලද ඝාතනයක් බව ය. අද ඒ ඝාතනයෙන් දිවි ගළවාගත් එකම තැනැත්තා කියන්නේ ඝාතනයට කොටි වගකිවයුතු බව ය. එසේ නම් හකීම් මහතා පොලිසියට විරුද්ධව ඝාතනය සම්බන්ධයෙන්  තීන්දුවක් දුන්නේ කෙසේ ද? ඔහුට ඒ සඳහා තිබූ සාක්‍ෂි කවරේ ද? දේශපාලන පක්‍ෂයක නායකයකුට රාජ්‍යාරක්‍ෂක නිලධාරීන්ට, හමුදාවට එරෙහිව එවැනි ප්‍රකාශ කළහැකි ද? මෙයට කලින් ද ඔහු එවැනි ප්‍රකාශ කර ඇත. අද කළ යුත්තේ ඔහු ආණ්ඩුවට එකතුකරගැනීමට වෑයම්කිරීම නොව එවැනි කරුණු සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්නකිරීම ය. ඇතිවෙමින් පවත්නා තත්වය ගැන ජාතික බලවේග නියෝජනය කරන සියළු දේශපාලන පක්‍ෂ දැඩි අවධානය යොමු කළ යුතු ය. එකිනෙකාට අවලාද කරන ප්‍රකාශ වහා නවතා දමා, නැවතත් නැගී එන විජාතික බලවේග මුල් අවස්ථාවේදී ම පරාජයකිරීම සඳහා වහා ක්‍රියා කළ යුතු ය. ජාතික බලවේග අතර ඇති වී තිබෙන නොහොඳ නෝක්කාඩු නැතිකිරීමට රාජපක්‍ෂ මහතා වහාම ක්‍රියාකරනු ඇතැයි බලාපොරොත්තු වෙමු. ඒ මහතාගේ ශක්තිය ඇත්තේ ජාතික බලවේගවල මිස හකීම් රනිල් සංධානයක නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva